රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය
பொது நிருவாக, உள்நாட்டலுவல்கள், மாகாண சபைகள் மற்றும் உள்ளூராட்சி அமைச்சு
Ministry of Public Administration, Home Affairs, Provincial Councils and Local Government

ඒකාබද්ධ සේවා අංශය | இணைந்த சேவைகள் பிரிவு | COMBINED SERVICES DIVISION

නිදහස් චතුරශ්‍රය, කොළඹ 07, ශ්‍රී ලංකාව. | சுதந்திரச் சதுக்கம், கொழும்பு 07, இலங்கை. | Independence Square, Colombo 07, Sri Lanka

| | | | |
|---|---|---|---|
| දුරකතන<br>தொலைபேசி:(94) 011- 2694560<br>Telephone | ෆැක්ස්<br>தொலைநகல்:(94) 011- 2692254<br>Fax | ඊ-මේල්<br>மின்னஞ்சல்:dgcs@pubad.gov.lk<br>E-mail | වෙබ් අඩවිය<br>இணையத்தளம்: www.pubad.gov.lk<br>Web Site |


| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය<br>எனது இல<br>My No | COM/TRANS/BR/GEN | ඔබේ අංකය<br>உமது இல<br>Your No | | දිනය<br>திகதி<br>Date | 2022.07.11 |

ඒකාබද්ධ සේවයේ සියලු කළමනාකරණ සේවා නිලධාරීන්ගේ දැන ගැනීම සඳහා

**<u>කළමනාකරණ සේවා නිලධරයන්ගේ වාර්ෂික නොවන ස්ථාන මාරු ඉල්ලීම් මාර්ගගතව (Online) ලබා ගැනීම</u>**

කඩදාසි භාවිතය අවම කිරීම හා සන්නිවේදනය පහසු කිරීමේ පියවරක් ලෙස වාර්ෂික නොවන ස්ථානමාරු ඉල්ලීම් මාර්ගගතව ගෙන්වා ගැනීම යෝග්‍ය වන බැවින් නියමු ව්‍යාපෘතියක් ලෙස කළමනාකරණ සේවා නිලධාරී සේවයේ නිලධාරීන් සඳහා වාර්ෂික නොවන ස්ථාන මාරු ඉල්ලීම් මාර්ගගතව (Online) ඉදිරිපත් කිරීමට අවස්ථාව සලසා ඇති බව කාරුණිකව දන්වා සිටිමි.

02. මාර්ගගත (Online) ඉල්ලීම් ඉදිරිපත් කිරීම සඳහා MISCO මෘදුකාංගය භාවිතා කළ යුතු අතර මෘදුකාංගය වෙත පහත පරිදි පිවිසිය හැක.

අ) LGN ඔස්සේ අන්තර්ජාල පහසුකම් සපයාගනු ලබන්නේ නම් http://10.250.1.112/misco/
ආ) වෙනත් ජාලයන් ඔස්සේ අන්තර්ජාල පහසුකම් සපයාගනු ලබන්නේ නම් http://43.224.125.68/misco/

MISCO මෘදුකාංගය වෙත පිවිස එහි අතුරු මුහුණතේ ඇති Help සබැඳිය ඔස්සේ ගොස් පරිශීලක අත්පොත (User Guide) පරිශීලනය කිරීමෙන් මේ සඳහා උපකාර වන තොරතුරු ලබාගත හැක.

03. මාර්ගගත ක්‍රමයට ස්ථාන මාරු අයදුම් කිරීම තුළින් සියළු නිලධාරීන්ට ස්ථාන මාරු ලබා දීමක් සිදු නොවන බවත් සේවා අවශ්‍යතාවය, ආයතන ප්‍රධානියාගේ නිර්දේශය, අනුප්‍රාප්තික අවශ්‍යතාවය, පූරප්පාඩු පැවතීම හා ප්‍රියමනාප සේවා ස්ථාන සඳහා සලකා බලනු ලබන අවශ්‍යතාවයන් වැනි සාධක සලකා බලමින් පමණක් ස්ථාන මාරු නියෝග නිකුත් කරනු ලබන බවත් කාරුණිකව දන්වමි.

04. මාර්ගගතව ඉල්ලීම් ඉදිරිපත් කිරීම අපහසු අවස්ථාවන්හි ඒකාබද්ධ සේවා චක්‍රලේඛ 02/2015 මගින් හඳුන්වාදී ඇති CST/01 ආකෘතිය මගින් [A4 කඩදාසියේ දෙපස (Both Sides) මුද්‍රිත] ඉදිරිපත් කිරීම ප්‍රමාණවත් වුවද හැකි සෑමවිටම මාර්ගගතව ඉල්ලීම් ඉදිරිපත් කිරීම තුළින් වඩා කාර්යක්ෂම සේවාවක් සැපයිය හැකි බවද දන්වා සිටිමි.

05. තවද මාර්ගගත ක්‍රමයට කරන ලද ඉල්ලීම් සඳහා ස්ථාන මාරු නියෝග මාර්ගගතව පමණක්, සෑම මසකම 01 වැනි හා 15 වැනි දිනවලදී නිකුත් කරනු ලබන බවද වැඩිදුරටත් දන්වා සිටිමි.

06. මේ සම්බන්ධයෙන් යම් ගැටළුවක් පවතී නම් msotransfer.pubad@gmail.com ඊ තැපැල් ලිපිනය ඔස්සේ තම ගැටළුව ඉදිරිපත් කළ හැකි අතර සේවාශ්‍රිත යම් ගැටළුවක් පවතී නම් පරිශීලකයෙකු ලෙස දත්ත පද්ධතියට ඇතුලත්ව එහි මෙනුවෙහි සඳහන් CS Inquiry ඔස්සේ ඔබගේ විමසීම් ඒකාබද්ධ සේවා අංශය වෙත ඉදිරිපත් කල හැකි අතර වැඩිදුර තොරතුරු විමසීම් පද්ධතිය තුල ඇති පරිශීලක අත්පොතෙහි (User Guide) සඳහන් වේ. තවද නිලධාරීන්ගේ තොරතුරු, දත්ත පද්ධතියට ඇතුලත් කිරීම සම්බන්ධයෙන් හෝ පද්ධතිය සම්බන්ධව තාක්ෂණික ගැටළු පවතීනම් CS Inquiry ඔස්සේ ගොස් ඉහල ඇති Add Inquiry සබැඳිය තෝරා Category හි System Related Matters ද Section හි PMO-TRANS යන්නද තෝරා ගෙන Descriptions හි තම ගැටළුව ඉදිරිපත් කල හැක.

07. ඔබගේ ඉල්ලීම සම්බන්ධව ඒකාබද්ධ සේවා අංශය මගින් ගත් පියවර සම්බන්ධයෙන් මුල් පිටුවෙහි (Home Page) Notice හරහා දැනගත හැකි අතර Special Messages (Service) හි මෙම අංශය විසින් ගත් පියවර සම්බන්ධයෙන් දැනුවත් කිරීම් සිදුකිරීමට කටයුතු කර ඇත. (මේ සම්බන්ධයෙන් දැනුවත්වීම සඳහා ඇමුණුම 01 පරිශීලනය කරන්න.)

08. ඒකාබද්ධ සේවා අංශය විසින් ඔබ සඳහා ලබා දෙන සේවාවන් කාර්යක්ෂමව පවත්වාගෙන යාම සඳහා ගනු ලබන මෙම ක්‍රියාමාර්ග සඳහා ඔබගේ කාරුණික සහයෝගය අපේක්ෂා කරමි.

එස්. ආලෝකබණ්ඩාර
ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල්

## 01. ස්ථාන මාරු සම්බන්ධ දැනුවත් වීම

පරිශීලක පිවිසුම ඔස්සේ පද්ධතියට පිවිසි විට දිස්වන මුල් පිටුවේ (Home Page) හි Notice හරහා දැනගත හැකි අතර Special Messages (Service) හි ඒකාබද්ධ සේවා අංශය මගින් සිදු කරන දැනුවත් කිරීම් සම්බන්ධයෙන් දැනුවත් විය හැක.




## 02. ස්ථාන මාරු සම්බන්ධ අවශ්‍යතා යාවත්කාලීන කිරීම

මෙහි දිස්වන Action යන්න තෝරා ගත් විට පහත පරිදි අතුරු මුහුණතක් (Inter Face) දිස්වන අතර, එහි ඇති Combo Box හි ඇති තෝරා ගැනීම් අතරින් තම අවශ්‍යතාවය සටහන් කරන්න.






එහි ඇති තෝරාගැනීම් අතරින් තවදුරටත් ස්ථාන මාරු අවශ්‍යතාවයක් නොමැතිනම් CANCEL යන්න තෝරා UPDATE Button තෝරා click කරන්න.එවිට ස්ථාන මාරු ඉල්ලීම ඉවත් වන අතර, එවැනි ඉල්ලීම් සම්බන්ධයෙන් නැවත සලකා බැලීමක් සිදු නොකෙරේ.

PENDING යන්න තෝරා ගනී නම්, අදාල ඉල්ලීම සම්බන්ධයෙන් ඉදිරි කටයුතු සඳහා දත්ත පද්ධතිය තුල රඳවා ගැනීම සිදු කරයි.

Type your remarks ලෙස සටහන්ව ඇති Text Box හි ඒකාබද්ධ සේවා අංශය වෙත දැන්විය යුතු කරුණක් ඇත්නම් එය ඇතුලත් කර UPDATE Button click කරන්න.

නිලධාරියාගේ ඉල්ලීම අනුව ස්ථාන මාරු වීම අනුමත කර ඇත්නම් Home Page හි ඇති Notice හි එය දිස් වේ.